# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 47 — 1973 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්දා — 1973 02.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II අ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 203 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 219 |


## තනතුරු-ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිසන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

### සැලකිය යුතුයි

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

(ඇ) දෙපාර්තමේන්තු සේවකයින් සඳහා :

(i) වයස් සීමාවක් නොතකා පිළිගත් විශ්ව විද්‍යාලයකින් කිනම් හෝ උපාධියක් ඇති කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වීම ;

(ii) රෙදි විවීමේ කටයුතු භාර නිලධාරි තනතුරේ යටත් පිරිසෙයින් අවුරුදු 7ක සේවයක් තිබීම හෝ වැඩ කළමනාකාර තනතුරේ යටත් පිරිසෙයින් අවුරුදු 18ක සේවයක් තිබීම.

(i) සහ (ii) යන්නෙන් සඳහන් වන නිලධාරීන්ට ගණිතය සාමාර්ථය ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකයක් තිබිය යුතුය.

සටහන :

(i) පේෂ කර්මාන්තය පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.

(ii) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින ජ්‍යෙෂ්ඨ විවීමේ කටයුතු නිලධාරීන්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ වැඩ කළමනාකරුවන්ගෙන් ඉල්ලුම් පත් භාර ගනු ලැබේ.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති ඉබෘතීස්ම සහතික භාරගනු නොලැබේ) ;

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක් ;

(ඈ) වෘත්තිය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සංලක්ෂ්‍යය.—(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස : (IIඅ) වන ඡෙදය ආරම්භයේ සඳහන් වන්නාවූ ද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන්නාවූ ද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එම්. සිවනාදන්,
ලේකම්,
කර්මාන්ත හා විද්‍යා අමාත්‍යාංශය.

1973.01.30,
48, ශ්‍රී ජිනරතන පාර,
තැ. පෙ. 570, කොළඹ 2.

බලවේග පේෂ කර්මාන්ත යෝජනා ක්‍රමයේ සාමාන්‍යාධිකාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ " බලවේග පේෂ කර්මාන්ත යෝජනා ක්‍රමයේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කර්මාන්ත හා විද්‍යා කටයුතු ලේකම් වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).
4. ජාතිය :————.
5. විවාහකද අවිවාහකද යන බව :————.
6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිනිය යුතුය).
7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.
8. මීට කලින් ආණ්ඩුවේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.
9. යම්කිසි සාපරාධි වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.
10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :————.

————
අත්සන..

දිනය :————.

02-509—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම ආයතනයෙන් ලබා ගත් පිළියෙල වූ අයදුම් පත් ලියකියවිලි සමඟ 1973.03.06 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ 5, එලිබෑන්ක් පාරේ අංක 33 පිහිටි ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ උඩ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

1. සහකාර ලේඛකාධිකාරී (මුදල්) :

සුදුසුකම්.—වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම විභාගයෙන් හෝ පිරිවැය හා වැඩ ගණකාධිකාරී ආයතනයේ I, II හා III වෙනි කොටස් වලින් සමත් වී සිටීම හා සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවුරුද්දක පළපුරුද්දක් තිබීම ; හෝ

අවුරුද්දක රජයේ හෝ සංස්ථා ගිණුම් පිළිබඳ පළපුරුද්ද ඇති IV වැනි පන්තියේ ගණකාධිකාරී වරයෙකු ; හෝ

කාර්මික විද්‍යාලයේ ගණකාධිකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් හෝ ඒ හා සමාන සුදුසුකම් ඇති 10 අවුරුද්දක පළපුරුද්දක් ඇති හා ලිපිකාර් සෙවයේ අධි පන්තියේ හෝ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු.

වැටුප.—මසකට රුපියල් 650—10×30—5×45—රු. 1,175 දක්වා. (සියළුම දීමනා ඇතුළුව).

අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි සුදුසු ස්ථානයක තැබීම ගැන සළකා බලනු ලැබේ.

වයස.—1973.03.06 වෙනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයින්ට බලපානු නොලැබේ.

ඇපය.—රුපියල් 10,000 ක ඇප ඔප්පුවකින් ඇප තැබිය යුතුයි.

2. ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරී—I වෙනි ශ්‍රේණිය :

සුදුසුකම්.—අයදුම්කරුවන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයන් විය යුතු අතර, අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයන් ලබා සිටිය යුතුය.

කෘෂිකර්ම ගැටලු පිළිබඳ අවබෝධයක් හා ගොවි කටයුතු අංශයෙහි පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

වයස.—අවුරුදු 22—35 ටත් අතර විය යුතුයි. ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සෙවකයින්ට බලපානු නොලැබේ.

වැටුප.—මසකට රුපියල් 650—10×30—5×45—රු. 1,175 දක්වා. (සියළුම දීමනා ඇතුළුව).

අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි සුදුසු ස්ථානයක තැබීම ගැන සළකා බලනු ලැබේ.

තෝරාගත් අපේක්ෂකයින් විසින් මෙම ආයතනයේ අදහස් හුවමාරුව පිළිබඳ අධ්‍යයනවලටද, ආයතනයේ සඟරාවන් සහ ආයතනය විසින් සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් පළ කරනු ලබන ප්‍රකාශනයන් සැකසීම පිළිබඳ වැඩ වලටද සහාය විය යුතු වේ, ඉංග්‍රීසි භාෂාව සිංහලට/දෙමළට පරිවර්තනය කිරීම සහ සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව අත්‍යවශ්‍යය.

3. ප්‍රවෘත්ති/ප්‍රකාශන නිලධාරී—II වෙනි ශ්‍රේණිය :

සුදුසුකම්.—අපේක්ෂකයන් අ. පො. ස (උසස් පෙළ) හෝ විශ්ව විද්‍යාල මධ්‍ය විභාගයෙන් සමර්ථ වී සිටිය යුතු අතර, ජ්‍යෙෂ්ඨ

පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සම්මාන සාමාර්ථයන් ද ලබා සිටිය යුතුය.

පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන් යටතේ අඩු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුය; හෝ

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවක් ඇතුළත්ව සම්මාන 4 ක් සමඟ එකම වාරයකදී විෂයයන් 6 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සාමාර්ථයක් ලබා තිබිය යුතු අතර, පිළිගත් ආයතනයක ප්‍රවෘත්ති හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි අවුරුදු 10 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුවේ.

කෘෂිකර්ම ගැටලු පිළිබඳ අවබෝධයක් හා ගොවිකටයුතු අංශයෙහි පළපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

**වයස.**—අවුරුදු 22—35 වත් අතර විය යුතුය.

ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයන්ට බලපානු නොලැබේ.

**වැටුප.**—මසකට රුපියල් 570—9×20—6×25—රු. 900 දක්වා (සියළුම දීමනා ඇතුළුව). අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

තෝරාගත් අපේක්ෂකයින් විසින් මෙම ආයතනයේ අදහස් හුවමාරු පිළිබඳ අධ්‍යයනවලටද, ආයතනයේ සඟරාවන් සහ ආයතනය විසින් සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් පළ කරනු ලබන ප්‍රකාශනයන් සැකසීම පිළිබඳ වැඩ වලටද සහාය විය යුතු වේ. ඉංග්‍රීසි භාෂාව, සිංහලට/දෙමළට පරිවර්තනය කිරීම සහ සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමේ හැකියාව අත්‍යවශ්‍යය.

4. වැඩ සැලසුම් නිලධාරි :

**සුදුසුකම්.**—ගණිතය සහ චිත්‍ර කර්මය ඇතුළුව අඩුම වශයෙන් සම්මාන 4 ක් සමග එක්වරකදී විෂයයන් 6 කින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

පිළිගත් කාර්මික ආයතනයක සැලසුම් සකස් කිරීම පිළිබඳ පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාවේ විභාගයෙන් හෝ ගොඩනැගිලි නිර්මානය හා සැලසුම් සකස් කිරීම පිළිබඳ තුන් අවුරුදු අර්ධකාලීන පාඨමාලාවේ විභාගයෙන් හෝ එබඳු ඊට උසස් විභාගයකින් සමත් වී තිබිය යුතුය.

සර්වේ ජනරාල්ගෙන් බලය ලත් සැලසුම්කරුවෙකු ලෙස ලබාගත් සහතිකයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. ආයතනය විසින් පවත්වනු ලබන දේශන, සම්මන්ත්‍රණ, පාඨමාලා, ප්‍රකාශන සහ ආයතනයේ ප්‍රගති පාලන කාමරය සඳහා කටු සටහන්, සිතියම්, සැලසුම්, රූපසටහන් ආදිය පිළියෙල කිරීම සැලසුම් නිලධාරීන්ගේ කාර්යයන්ට අයත් වේ.

අපේක්ෂකයින්ට රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ වාණිජ ආයතනයක සැලසුම්කරුවෙකු වශයෙන් අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස.**—අවුරුදු 22—35 ට අතර විය යුතුය. ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයන් වෙත බලපානු නො ලැබේ.

**වැටුප.**—මසකට රුපියල් 570—9 × 20—6 × 25—900 දක්වා (සියළුම දීමනා ඇතුළුව). අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

5. සැලසුම්කරු (පහළ ශ්‍රේණිය) :

**සුදුසුකම්.**—ගණිතය හා චිත්‍ර කර්මය ඇතුළුව අඩුම වශයෙන් සම්මාන 4 ක් සහිතව එක්වරකදී විෂයයන් 6 කින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

පිළිගත් කාර්මික ආයතනයක සැලසුම් සකස් කිරීම පිළිබඳ පූර්ණ කාලීන එක් අවුරුදු පාඨමාලාවේ විභාගයෙන් හෝ ගොඩනැගිලි නිර්මාණය හා සැලසුම් සකස් කිරීම පිළිබඳ තුන් අවුරුදු අර්ධ කාලීන පාඨමාලාවේ විභාගයෙන් හෝ එබඳු ඊට උසස් විභාගයකින් සමත් වී තිබිය යුතුය.

සර්වේ ජනරාල්ගෙන් බලය ලත් සැලසුම්කරුවෙකු ලෙස ලබාගත් සහතිකයක් තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකෙනු ඇත. රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථාවක හෝ වාණිජ ආයතනයක සැලසුම් කරුවෙකු ලෙස අඩුම වශයෙන් අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස.**—අවුරුදු 22-35 ට අතර විය යුතුය. ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයන් වෙත බලපානු නො ලැබේ.

**වැටුප.**—මසකට රුපියල් 350—10 × 15—5 × 20—600 දක්වා (සියළුම දීමනා ඇතුළුව).

අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයේ සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

6. ලඝු/යතුරු ලේඛකයින්—සිංහල/දෙමළ/ඉංග්‍රීසි :

**සුදුසුකම්.**—එක් වාරයකදී විෂයයන් 6 ක් සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ලඝුලේඛක වේගය විනාඩියකට වචන 60-80 හා යතුරු ලියන වේගය විනාඩියකට වචන 50 විය යුතුය.

නිවේදන සහ උපලේඛන පිළියෙල කිරීම ඇතුළත් වන පිටපත් යතුරු ලිවීමද තෝරාගත් අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ.

ඉතාම පැහැදිලිව හා නිවැරදිව යතුරු ලිවීමේ හැකියාවක් අයදුම්කරුවන්ට තිබිය යුතුය.

පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් වෙත වඩාත් සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස.**—අවුරුදු 22-35 ට අතර විය යුතුය. ඉහළ වයස් සීමාව රජයේ හෝ සංස්ථා සේවකයන් වෙත බලපානු නො ලැබේ.

**වැටුප.**—මසකට රුපියල් 275—7 × 10—7 × 15—450 දක්වා (සියළුම දීමනා ඇතුළුව).

අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

**සේවා කොන්දේසි.**—තෝරාගත් අයදුම්කරුවන්—

(අ) වර්ෂ දෙකක් ආධුනික තත්ත්වයේ සිටිනු ඇත. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා හා ආයතනවල ස්ථිර නිලධාරීන් වර්ෂයක් තුළ වැඩ බැලීමට පත් කරනු ඇත.

(ආ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ රෙගුලාසිවලට හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති හෝ අනාගතයේදී රජය විසින් පැනවීමට හැකි රාජ්‍ය භාෂා රෙගුලාසිවලට යටත් විය යුතුය.

(ඇ) ජාතික සුභසාධක අරමුදලට මුදල් ගෙවිය යුතු අතර 1972 අංක 5 දරණ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ දැනට පනවා ඇති හා අනාගතයේදී පැනවිය හැකි රෙගුලාසිවලට යටත් විය යුතුය.

**සාමාන්‍ය කොන්දේසි :**

1. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) පිළිගත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක් ; ඉන් එකක් අන්තිම වරට අධ්‍යාපනය ලැබූ අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාගෙන් විය යුතුය.

(ඇ) ලබාගත් ඉහලම අධ්‍යාපන සහතිකය.

(ඈ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි වලින් සමත් වූ ඉහලම විභාගය පිළිබඳ සහතිකය.

2. ඉල්ලුම්පත් ලැබුනු බවට දැනුම්දීමක් නොකරනු ඇත. මෙම දැන්වීමේ අවශ්‍යතාවලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. අවශ්‍ය වූ විට ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

3. කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් කැඳවනු ඇත. ගමන් වියදම් හෝ වෙනත් වියදම් නොගෙවනු ලැබේ.

4. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයක් හා සෞඛ්‍ය තත්වයක් ඇති බව ඔප්පු කළ යුතුය

5. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් හැර සෙසු තෝරාගත් අපේක්ෂකයන් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් කරනු ලබන ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බව පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණයකට යටත් විය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු ලබන්නේ, මෙම තනතුරට තෝරා ගතහොත් මුදා හැරීමට සූදානම් බවට නිර්දේශයක් සහිතව දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කළහොත් පමණි.

අධ්‍යක්ෂ,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

33, එලිබෑන්ක් පාර,
කොළඹ 5.

02-579—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ උපදේශක කථික තනතුර**

**ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ උපදේශක** කථික තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම සුදුසුකම් ඇති පරිදි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල වුණු අයදුම්පත් 1973. 03. 15 වෙනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට ඒකාබද්ධ රු. 3,000—90 × 24—5,160.

**සටහන.**—(1969. 10. 1 දිනට පෙර පැවති කල්පිත මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 960—72—2,688).

3. **අවශ්‍ය සුදුසුකම්.**—(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත් විභාගයෙන් හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික **පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයයන් හයකින් ලබාගත්** සාමාර්ථයක් තිබිය යුතුයි. එම විෂයයන් අතුරෙන් අංක ගණිතය/ මූලික ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි ජීව විද්‍යාව හා භූගෝල විද්‍යාව **සමත්වී තිබිය යුතු අතර, ජීව විද්‍යාවට හා භූගෝල විද්‍යාවට සම්මාන** සාමාර්ථ ලබා තිබිය යුතුය. පාසලේදී කථික තරගවලට හා සාහිත්‍ය තරඟවලට සහභාගිවූ අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ii) **සිංහල, දෙමළ හා ඉංග්‍රීසි කථා කිරීමේ මනා නිපුනතාවයක්** තිබිය යුතුයි.

**සටහන.**—ඉගැන්වීම හා/හෝ පුවත්පත් කලාව පිළිබඳ පළපුරුද් දක් තිබීම අමතර සුදුසුකමක් වේ.

4. 73. 03. 15 දිනට වයස.—වයස අවුරුදු 20 කට නො අඩු හා **අවුරුදු 30 ට නො වැඩි විය යුතුයි. දැනට රජයේ සේවයේ නියුක්ත** වූවන්ට උපරිම වයස් සීමාව බල පාන්නේ නැත.

5. **යහපත් චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්තවිය යුතුය.**

6. රජයේ සේවයේ දැනටමත් නියුක්ත අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් නියමිත දිනට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී එම පමාවීමට සෑහෙන හේතු ඇතිව භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් **නිර්දේශ කළහොත් මිස භාර ගනු නොලැබේ.**

7. **අයදුම්කරු ස්වකීය අයදුම්පත්වලට පහත සඳහන් සහතිකවල** පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය:—

(අ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ආ) උප්පැන්න සහතිකය.

(ඉ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්. (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ).

8. **අයදුම්පත් හා ඊට අදාල වෙනත් ලියකියවිලි අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා** ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙක් වෙත පෞද්ගලිකව නොඑවිය යුතුය.

9. මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් රහිතය. තෝරා පත්කර ගන්නා තැනැත්තා විසින් සම්පූර්ණ වැටුපෙන් මසකට 6% බැගින් රා. සේ. අ. සා. අරමුදලට දායක මුදල් ගෙවිය යුතුවේ. මෙයට රජයෙන් 9% ක දායක මුදල් ගෙවනවා ඇත.

10. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වෙනි ඡේදයේ ආරම්භයෙහි ප්‍රසිද්ධකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් අදාලවන සාමාන්‍ය කොන්දේසිවලට අයදුම්කරුවන්ගේ අවධානය යොමු කෙරේ.

**ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,**
**සත්වෝද්‍යාන අධ්‍යක්ෂ.**

ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව,
අනගාරික ධර්මපාල මාවත,
**දෙහිවල,**
**1973. 02. 07.**

අයදුම් පත් ආකෘතිය

**ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ උපදේශක කථික තනතුර**

1. සම්පූර්ණ නම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.
 (ආ) 73.03.15 දිනට වයස :————.

4. ලංකාවේ පුරවැසියෙක් ද යන බව :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.

6. වෘත්තීය සුදුසුකම් :————.

7. චරිත හා වෘත්තීය පිළිබඳ සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ ලිපිනය :————.

8. වෙනත් කරුණු :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට මා තෝරාගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස් සෙකු කිරීමට හැකි වුවත්, පත් කරනු ලැබුවායින් පසු සොයාගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ලිපිනය :————.

දිනය :————.

2–584—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම් පත් 1973 මාර්තු මස 15 වැනි දින හෝ ඊට පෙර **පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ලැබෙන** සේ එවිය යුතුයි. ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් නොසැපයේ.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :—**

i (අ) **ස්ථිර තනතුරුවලට පත්වීමේදී, මුල් අවස්ථාවේදී පත්වීම** ලබා අවුරුදු තුනක් ගතවන තුරු ආධුනික භාවයේ සිටිය යුතුයි.

(ආ) තාවකාලික තනතුරුවලට පත්කිරීම හුදෙක්ම තාවකාලික පදනමක් මත කෙරෙනවා ඇත. එසේ පත්වූවන්ට රජය යටතේ ස්ථිර පත්වීම් ලැබීමට කිසිදු හිමිකමක් පෑමට අයිතියක් නොමැති බව පැහැදිලිවම තේරුම් ගත යුතුයි. මෙම පත්කිරීම් රජයේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය. කෙසේ වෙතත් තාවකාලික පදනමක් මත බඳවා ගන්නා කෘෂිකර්ම උපදේශකයින්, ඔවුන්ගේ තාවකාලික සේවා කාලය අවසානවීමට පෙර ඇතිවන ස්ථිර තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බඳවා ගැනීමට සළකා බලනු ලැබේ.

ii. තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පත්වීම ලබා අවුරුදු 3 ක් ඇතුලතදී සිංහල පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් විය යුතුයි. මුල් වර්ෂය තුළ දෙමළින් වැඩ කිරීමේ දැනුමක් ද ලබාගත යුතුය.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරුවලට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය පහත දැක්වේ :—

**අවුරුද්දකට රු. 3,864 සිට රු. 144 වැඩිවීම් 19 ක් සහ රු. 180 වැඩිවීම් 4 කින්, රු. 7,320 දක්වා වැඩි වන** (රු. 4,584 හා රු. 6,024 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත) වැටුප් ක්‍රමයක් මීට අයත් ය.

**පළමුවැනි පන්තිය.**—අවුරුද්දකට රු. 7,500 සිට රු. 180 වේ වැඩිවීම් 3 කින් හා රු. 240 වැඩිවීම් 2 කින් රු. 8,520 දක්වා වැඩිවේ.

විශේෂ පන්තිය.—අවුරුද්දකට රු. 8,760 සිට රු. 240 වැඩිවීම් 3 කින්, රු. 9,480 දක්වා වැඩිවේ.

**සටහන :**

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයන් හා කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් 1 වැනි හෝ 2 වැනි පෙළ සාමාර්ථය ලත් තෝරා ගත් අපේක්ෂකයින් රු. 3,864 ආරම්භක ඒකාබද්ධ වාර්ෂික වැටුපේ තබනු ඇත. මේ සියලු දෙනාම පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මෙම පරීක්ෂණයෙන් නියමිත කාලය තුළ සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාද කිරීමට හේතුවේ.

(ii) කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් "සාමාන්‍ය" සාමාර්ථය ලත් තෝරාගත් අපේක්ෂක යින්ට වර්ෂයකට රු. 3,180 ක ඒකාබද්ධ වැටුපක් ගෙවන අතර, දෙපාර්තමේන්තු ආධුනිකයින්ගේ විභාගයේ 1 වෙනි කොටසින් සමත් වූ දින සිට ඒකාබද්ධ වාර්ෂික වැටුප රු. 3,864 වැටුප් තලයේ තබනු ලැබේ. මේ අයද පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයකින් සමත් විය යුතු අතර, නියමිත කාලය තුළ එයින් සමත්වීමට අපොහොසත්වීම ඊළඟ වැටුප් වැඩිවීම ප්‍රමාද කිරීමට හේතුවේ. පත්වීමේ දින සිට වර්ෂයක් ඇතුළත ආධුනිකයින්ගේ විභාගයේ 1 වන කොටසින් සමත් නොවන අය, රු. 3,864 ඒකාබද්ධ වැටුප් තලයේ තැබීමට එම විභාගයෙන් සහ දෙපාර්තමේන්තු ජාතික භාෂා පරීක්ෂණයෙන් ද සමත් විය යුතුයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973 මාර්තු 15 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි බව (දැනට රජයේ ස්ථිර තනතුරු දරන්නන්ගේ වයස් සීමාව නොසලකා ඉල්ලුම් පත් භාරගනු ලැබේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙක්

**හෝ**

(ඈ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, අංක ගණිතය හෝ ගණිතය සහ වෙනත් විෂයයන් හතරකින් සාමාර්ථය ලබා ඉන් විෂයයන් පහක් එකම විභාගයේදී එකවරම සමත්වී ඇති අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඒ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථයක්, සහ

(ii) පේරාදෙණියේ හෝ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ සහතිකය දරන්නකු විය යුතුය.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම් පත්වලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සෑ. යු. අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) සිංහල විෂයයන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(ඈ) ළඟදී ලබාගත් චරිත සහතික දෙකක්. (දැනට රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් මෙම උප වගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීමට උවමනා නැත.)

**සංලක්ෂ්‍යය.**—මෙම සහතික පත්‍ර පිටපත් ආපසු එවනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම් කරුවන්ගේ ඉල්ලුම් පත් එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බවත්, ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් පිළිගත යුතුයැයි නිර්දේශ නොකරත හොත් සලකා බලනු නොලැබේ.

7. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පරිපාලන)ට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. **මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්** බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1973 ජනවාරි මස 29 වැනි දා,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක තනතුරු

1. සම්පූර්ණ නම :————.
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) වෙනත් නම් :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය සහ 1973 මාර්තු මස 15 වැනි දිනට වයස :————.
4. ජාතිය සහ එය කෙසේ ලබාගත්තේ ද යන වග :————.
5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඇ) ඔහුගේ පිය පක්ෂ මුත්තා :————.
   (ඈ) ඔහුගේ පිය පස මී මුත්තා :————.
6. අයදුම්කරු කසාද බැඳලාද, නැද්ද යන වග :————.
7. ලබා ඇති අධ්‍යාපනික හා/හෝ වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
8. සිංහල විෂයයෙන් සමත් වූ පරීක්ෂණය (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
9. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද ? එසේ නම් දැරූ ධුරය සහ ඉන් අස්වීමට හේතු සඳහන් කළ යුතුය :————.
10. යම්කිසි විශේෂ හිමිකම්, සුදුසුකම් හෝ පළපුරුද්දක් ඇතිනම් සඳහන් කරන්න :————.
11. මීට පෙර ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම්කර තිබේද ? එසේ නම් දින සඳහන් කරන්න :————.
12. චරිත සහතික ඉදිරිපත් කර ඇති අයගේ නම් සහ තනතුරු නාමය (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.
13. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–577—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ආයුර්වේද දෙපාර්තමේන්තුව

ආයුර්වේද රෝහල්හි සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු

**අංක 42 හා 1973 ජනවාරි මස 12 වැනි දින දරන, ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (IIඅ) ඡේදයේ පළ කරන ලද 1972 දෙසැම්බර් මස 27 වැනි දින දරන මගේ නිවේදනයේ සඳහන් කරන්නට යෙදුන, පූර්වෝක්ත තනතුරු සඳහා අයදුම් පත් භාර ගන්නා අවසාන දිනය, 1973 පෙබරවාරි මස 26 වැනි දින දක්වා** දීර්ඝ කර ඇති බව අදාල අයදුම්කරුවන්ගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 පෙබරවාරි මස 01 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

2–545—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "යාන්ත්‍රික ඉන්ජිනේරු සහකාර" තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—(1) යෝග්‍ය පුහුණුවක් සහිතව කටුබැද්ද, ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ඉන්ජිනේරු විද්‍යාව පිළිබඳ කාර්මික පාඨමාලාවේ අවසාන සහතිකය හෝ යාන්ත්‍රික ඉන්ජිනේරු විද්‍යාව පිළිබඳ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය.

(2) විශාල ඩීසල් යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තු කරවීම පිළිබඳව පුළුල් දැනුමක්.

(3) ඩීසල් යන්ත්‍ර ස්ථාපනය කිරීමේ පළපුරුද්ද.

(4) වැඩපල පුහුණුව හා යාන්ත්‍රික ඉන්ජිනේරු අභ්‍යාස පිළිබඳව මනා දැනීමක් හා පලපුරුද්දක්.

(5) සේවකයින් හසුරුවීමේ හැකියාව.

(6) පරිපාලන තත්වයේ අවුරුදු 5 ක පලපුරුද්ද.

**වයස් සීමාව.**—අවුරුදු 25–40 දක්වා.

**වැටුප් ක්‍රමය.**—රු. 680—860 (30 × 60) කි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම් පත් 1973 මාර්තු මස 10 වැනි දිනට පෙර කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියා පදිංචි කල තැපැලෙන් එවිය යුතුය. ලිපි කවරයේ ඉහල වම් කෙළවර "යාන්ත්‍රික ඉන්ජිනේරු සහකාර" යනුවෙන් සඳහන් කල යුතු වේ.

ඔස්වල්ඩ් තිලකරත්න
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්,

1973 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන අයදුම් පත

### ලංකා ගුවන් විදුලි සංස්ථාව

..............................තනතුර සඳහා අයදුම්පතයි.

1. සම්පූර්ණ නම :————.

(අ) මුල් අකුරු සහිත නම :————.
(මහත්මයා ද, මහත්මිය ද, මෙනවියද යන වග සඳහන් කරන්න).

2. පුද්ගලික ලිපිනය :————.

3. උපන් දිනය :————.

1973 මාර්තු 10 වැනි දිනට වයස අවු : ——මාස : ——දින : ——
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය).

4. ජාතිය :————.

5. අධ්‍යාපන හා පුහුණුවීම් :

| අධ්‍යාපනයලැබූ පාසැල් හා ආයතන | දින සිට දක්වා | සමත්වී ඇති විභාගය | දුරු වගකිවයුතු තත්ත්ව හා යෙදුණු පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| | | | |

6. සමත්වී ඇති උසස්ම විභාගය :—

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————

7. කාර්මික/වෘත්තිය සුදුසුකම් :————.

8. පළපුරුද්ද :————.
(ඔබගේ අතීත පලපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාලක්‍රමානුගතව යොදන්න).

9. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම්, ලිපින හා තත්ත්ව :—

1.

2.

3.

10. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම් හා තනතුරු :————.

1.

2.

3.

11. වෙනත් විස්තර :————.

මා ඉහත ප්‍රකාශ කොට ඇති කරුණු නිවැරදි හා සත්‍ය තොරතුරු බවත් මා ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සේවයට පත් වුවහොත් මා විසින් ඉහත දෙන්නට යෙදුණු අසත්‍ය හෝ වැරදි තොරතුරක් වෙතොත් එම හේතුවෙන් සේවයෙන් පහ කිරීමේ දඬුවම් ලැබීමට මා සුදුසුස්සකු වන බවත්, විශේෂයෙන්ම මීට පෙර රැකියාවල් පිළිබඳ හෝ මීට අදාළ වැදගත් ක්‍රියාකම් කරුණක් පිළිබඳව හෝ හිතා මතා වයන් කිරීම නිසා එවැනි දඬුවමක් මට එල්ල වන බවත් මා වටහා ගත් බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————————
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

2–629—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ කිරිඇල්ල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කුරුවිටි කෝරළේ කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කිරිඇල්ල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කායාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායාලය, ග්‍රාම සේවක කායාලය, පළාත් පාලන ආයතන සහ කායාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායාලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 මාර්තු 15 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ජී. සමරසිංහ,
දිස්ත්‍රික් ලේකම්.

1973 පෙබරවාරි 1 වෙනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායාලයේ දී ය.

02–487—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### පුරප්පාඩු

**ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහන නිවේදක තනතුරු—(දෙමළ)**

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දෙමළ සහන නිවේදක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටා ඇති ගුවන් විදුලි සංස්ථා කාර්යාලයේ සිට සැතපුම් 5 ක් සීමාව ඇතුළත වාසය කරන්නන් විය යුතු අතර, කිසිම රැකියාවක හෝ ව්‍යාපාරයක නිරත නොවූවන් විය යුතුයි. තෝරා ගනු ලබන අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවාවට බඳවාගනු ලබන අතර, දිනකට රු. 24 ක උපරිම සීමාවකට යටත්ව වැඩ කරන පැයකට රු. 3 බැගින් ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

2. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, එකවර විෂයයන් හයක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත්වූ අය විය යුතුයි. එමෙන්ම දෙමළ භාෂාව පිළිබඳ සුදුසු තත්ත්වයක ප්‍රවීනත්වයක් ලබා තිබිය යුතුයි.

3. තෝරාගනු ලබන අයදුම්කරුවන් කෙටි කාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණුවීම වෙනුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

4. සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ ස්ථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විටකදී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ඇත.

5. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1973 මාර්තු 03 වැනි දිනට පෙර, කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සහන නිවේදක තනතුර—දෙමළ" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුයි.

6. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු නො ලැබේ.

ඔස්වල්ඩ් තිලකරත්න,
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්.

1973 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ 7.

#### නිදර්ශන අයදුම්පත

1. සම්පූර්ණ නම :————.
2. මුල් අකුරු සහිත නම :————.
   (මහත්මයාද, මහත්මියද, මෙනෙවියද, යන වග සඳහන් කරන්න.)
3. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :————.
4. උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
5. 1973.03.03 වැනි දිනට වයස :— අවුරුදු :————, මාස :————, දින :————.
6. ජාතිය :————.
7. අධ්‍යාපන සුදුසුකම් :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
8. භාෂා පිළිබඳ ප්‍රවීණතාව :—
   (අ) දෙමළ :————.
   (ආ) ඉංග්‍රීසි :————.
   (ඇ) වෙනත් භාෂා :————.
   (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
9. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු පිළිබඳ පළපුරුද්ද හා වෙනත් විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.
10. දැනට කිසියම් රැකියාවක නිරතව ඇත්නම් ඒ පිළිබඳ විස්තර: ————.
11. චරිත සහතික ලබාගත් දෙදෙනෙකුගේ නම් හා ලිපින :————.
    (සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

මෙම අයදුම්පතෙහි ම විසින් ඇතුළත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුරු සඳහා නුසුදුස්සකු වන බව මා දන්නා අතර, පත්වීම ලද පසු, වරදක් හෝ අසත්‍යතාවක් හෙළිවුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2-628—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

**තනතුරු ඇබෑර්තු**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පහත සඳහන් තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

**ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පි තනතුර :**

**සුදුසුකම්.**—සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සමග ගෘහ නිර්මාණ ශිල්පි උපාධිය ලැබීමෙන් පසු අවුරුදු 10 ක පළපුරුද්දක් තිබීම හෝ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සමග අවුරුදු 8 ක පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය.**—රු. 1,800—4 × 50—රු. 2,000 මසකට සියල්ල අඩංගු).

අයදුම්පත් නියමිත ආකෘති පත්‍රයන්හි විය යුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබාගත හැකිය. අයදුම්පත් කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, 120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 1973.02.28 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථාවල නියුක්ත වූවන්ගේ අයදුම්පත් එකී දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

1973 ජනවාරි මස 31 වැනි දින,
තැ. පෙ. 194,
120, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

2-644—73 .02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### යාපනය නගරයේ හදිසි මරණ පරීක්ෂක තනතුර

යාපනය නගරයේ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා මරණ පරීක්ෂක වරයෙකු පත් කිරීම පිණිස යාපනය නගර ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් ඉල්ලුම්පත් යාපනය දිසාපති විසින් භාරගනු ලැබේ.

2. රජයේ, සංස්ථා සහ පළාත පාලන ආයතනවල සේවකයන්ගෙන් පළාත් පාලන / ආයතනවල නියෝජිතයින්ගෙන් සහ 1973.02.28 වැනි දිනට වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි අයගෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.

3. සෑම අයදුම්කරුවකු විසින් ම පහත සඳහන් විස්තර හා ලිය කියවිලි සැපයිය යුතුව ඇත :—

(i) සම්පූර්ණ නම සහ ලිපිනය;
(ii) පදිංචි ස්ථානය;
(iii) වයස සහ උපන් දිනය;
(iv) විවාහකද අවිවාහකද යන වග;
(v) අධ්‍යාපන සුදුසුකම් :
    ඉංග්‍රීසි.
    දෙමළ.
(vi) දැනට දරණ හෝ කලින් දැරූ හෝ තනතුරු;
(vii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

ඇම්. පී. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිසාපති.

1973 ජනවාරි 31 දින,
යාපනය දිසාපති කාර්යාලයීය
පාලන ශාඛාවේ දීය.

2-553—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා යුද හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි තනතුරු

ශ්‍රී ලංකා යුද හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ලංකාවේ පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකා පුහුණුවීමේ කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව, ශිෂ්‍යභට නිලධාරීන්ට දෙවැනි ලුතිනන් වන ආරම්භක නිලයේ අධිකාරයට පත්කොට ශිෂ්‍යභට නිලධාරියාගේ යෝග්‍යතාවයන් මෙන් ම ශ්‍රී ලංකා යුද හමුදාවේ අවශ්‍යතාවයන්ද අනුව ඔවුන් යුද හමුදාවේ බලකායකට හෝ සේවාවට ඇතුලත් කරණු ලැබේ.

3. යෝග්‍යතාවය.—අයදුම්කරුවන්—

(අ) ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය ;

(ආ) 1973 මාර්තු මස 10 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩුවද 24ට නොවැඩිව ද විය යුතුයි ;

(ඇ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි හෝ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය සමග, යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ හතරක් සහිතව දෙවරකට නොවැඩි ගණනකින් ශ්‍රී ලංකා අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී විෂයයන් හයකින් සමත් විය යුතුය.

සැලකිය යුතුයි.—සාමාන්‍ය සුදුසුකම්වලට යටත්ව, භෞතික විද්‍යාවෙන් සහ ගණිතයෙන් සම්මාන සාමාර්ථ ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ :—

(ඈ) අයදුම්කරුවන් අවිවාහකයන් විය යුතුය. පුහුණුවීම ලබන කාලය තුළදී ශිෂ්‍යභට නිලධාරියෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

(ඉ) අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වයෙහි සිටිය යුතුවේ. අවසාන සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන් එම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට පෙර ශ්‍රී ලංකා යුද හමුදාව මගින් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

4. සේවා කොන්දේසි.—

(අ) තෝරාගනු ලබන අපේක්ෂකයින් ශිෂ්‍යභට නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලබන අතර, නිත්‍ය සේවයේ අවුරුදු 5කට සහ උප සේවයේ අවුරුදු 7ක කාලසීමාවකට බඳවා ගනු ලැබේ ;

(ආ) පුහුණුවීම ලබන කාල සීමාව තුළදී ශිෂ්‍යභට නිලධාරියෙකුගේ වාර්ෂික වැටුප රු. 5,160කි. ශිෂ්‍යභට නිලධාරියෙක් වශයෙන් සේවය කරන කාලය තුලදී ඔහුට කිසිම වැටුප් වැඩිවීමකට හිමිකමක් නොමැත ;

(ඇ) යුද හමුදාපති විසින් නියම කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ පුහුණුවීම්වල නිරත වීම ශිෂ්‍යභට නිලධාරීන්ට අවශ්‍ය වේ. පුහුණුවීමේ කාල සීමාව මාස 18 ක් පමණ වේ ;

(ඈ) පුහුණුවීමේ කාල තුළදී ශිෂ්‍යභට නිලධාරීන්ගේ තරාතිරම සෙසු නිලයන් හා සමාන වන අතර, ඔවුන් යුද හමුදා නීතියට යටත් වනු ඇත

(ඉ) (i) පුහුණුවීමේ කාල සීමාව තුළදී ශිෂ්‍යභට නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ තම අපේක්ෂකත්වය හමාර කළහොත් එතෙක් එම ශිෂ්‍යභට නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මගින් දරන්නට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුය ;

(ii) ශිෂ්‍ය භට නිලධාරියෙක් පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක වුවත්, විෂමාචාරය හේතුන් නිසා හෝ තමන් විසින් ම වලක්වා ලිය හැකි හේතුන් නිසා හෝ අධිකාරය පිරිනැමීමට නුසුදුසුයැයි බලධාරීන් විසින් වාර්තා කරණු ලැබුවහොත්, ශ්‍රී ලංකා ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුන සියළුම වියහියදම් දෙමව්පියන් හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුය ;

(ඊ) අධිකාරයට පත්කිරීමේදී, ශිෂ්‍යභට නිලධාරියෙකු වශයෙන් නිත්‍ය බල හමුදාවට ඇතුලත් වූ බැඳීමෙන් ශිෂ්‍යභට නිලධාරීන්ව මුදා හරිනු ලැබේ.

(උ) නිලධාරීන් වශයෙන් අධිකාරයට පත් කිරීමෙන් පසුව අඩු වශයෙන් අවුරුදු 7ක් යුද හමුදාවේ සේවය කළ යුතුවේ ;

(ඌ) වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසිවලින් නිලධාරීන්ට බලපවත්වනු ලැබේ :—

(1) 1961 අප්‍රියෙල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද හමුදා වැටුප් සංග්‍රහය ;

(2) 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිලධාරීන්ගේ රෙගුලාසි ;

(3) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1961 විශ්‍රාම වැටුප හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

4. (එ) තනතුර විශ්‍රාම වැටුප් රහිත ය. ශිෂ්‍යභට නිලධාරියෙකු වශයෙන් තෝරා ගනු ලබන අයදුම්කරු විසින්, අර්ථසාධක අරමුදලට සිය දායක මුදල් වශයෙන් තමාගේ ඒකාබද්ධ වැටුපෙන් 6%ක ප්‍රමාණයක් අඩුකර ගැනීම සඳහා සිය කැමැත්ත ලිඛිතව දිය යුතු වන්නේ ය. සේවා විශ්‍රාම වැටුපක් සහ පාරිතෝෂික දීමනාවක් ගෙවීම පිළිබඳව, 1961 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයේ දක්වෙන රෙගුලාසි බලපාන්නේ නැත.

5. මෙහි පහත 6 වැනි ඡෙදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශ පත්‍රයකට අත්සන් කළ යුතු වන අතර එය අයදුම් පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතු වේ. අපේක්ෂකයන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත්කිරීමට පෙර ප්‍රකාශ පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ජනරජයත් සමග ඇපකරයකට අත්සන් කළ යුතුය.

6. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

(අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ ශිෂ්‍යභට නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ................................ ගේ පියා/මව/භාරකරු මම වෙමි.

(ආ) ශ්‍රී ලංකාවේ පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා පහත නම සඳහන් අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත්, මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාරගනිමි :—

(i) පුහුණුවීමේ කාල සීමාව තුළදී, අයදුම්කරු හට දරන්නට වන සියළුම පෞද්ගලික වියදම් දැරීමට ;

(ii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරය සඳහා වූ නම අපේක්ෂකත්වය හමාර කළහොත්, ඔහු වෙනුවෙන් දරන්නට වූ සියළුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට ;

(iii) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතුන් හෝ නිසා) අධිකාරය ලැබීමට නුසුදුසු යයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ සියළුම වියහියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට ද වේ.

―――――――,
අත්සන.

නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :――――.

දිනය :――――.

සාක්ෂිකරුගේ අත්සන :――――.

නම සහ ලිපිනය (පැහැදිලි අකුරෙන්) :――――

7. භාෂා අවශ්‍යතා— ශ්‍රී ලංකා ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම, මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද, අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

8. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර, අපේක්ෂකයා තෝරාගත හොත් මුදලිය හැකි බවට සහතිකයක් ද සහිතව, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

9. ඉල්ලුම් පත්‍ර.—ඉල්ලුම් පත්‍ර පහත දක්වෙන ආකෘතියට අනුව ලියා 1973 මාර්තු 10 වැනි දින දහවල් 12ට හෝ එයට පෙර ලැබෙන සේ " යුද හමුද මූලස්ථානය, තැ.පෙ. 553, කොළඹ " යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ " යුද හමුදවේ ශිෂ්‍යභට නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය " යනුවෙන් සඳහන් කළ යුතු වේ. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසුව මෙම මූලස්ථානයට ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

10. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය:—

(අ) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය ;

(ආ) දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතිකය ;

(ඇ) අයදුම්කරුවා පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයින්ගෙන් මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික. යටත් පිරිසෙයින් දෙකක්, මින් එක් සහතිකයක් අයදුම්කරු අවසාන වරට ඉගෙනීම ලැබූ පාසැලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු වේ.

11. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන්ට මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද හමුදපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

12. තේරීම් මණ්ඩල මගින් සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව හා දිනය ලිපියකින් දනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරණු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදපති වෙනුවට.

1973 ජනවාරි 31 වැනි දින.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ශිෂ්‍යභට නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. පුරවැසි බව (ලාංකික වනුයේ පරම්පරාවෙන්ද, නැතහොත් ලියාපදිංචිවීමෙන් ද යි දක්වා, ලියාපදිංචිවීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න) :————.
4. (i) උපන් දිනය (උප්පැන්න සහතිකයකින් සනාථ කළ යුතුය. බෞතිස්ම සහතිකය හෝ අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කරනු ලබන සහතිකය පිළිගනු නොලැබේ) :————.
   (ii) 1973 මාර්තු 10 වැනි දිනට වයස :—අවුරුදු :————. මාස :————. දින :————.
5. ආසන්න පොලිස් ස්ථානය :————.
6. පියාගේ නම සහ උත්පත්තියේදී ජාතිය : (පුරවැසි බව ලැබූවෙකු නම්; සහතිකයේ දිනය හා අංකය සඳහන් කරන්න) :————.
7. මවගේ නම සහ උත්පත්තියේදී ජාතිය :————.
8. ඔබේ පාසැල් සමයේ පහත සඳහන් විස්තර සපයන්න :—

| පාසැලේ නම | ඇතුල් වූ දිනය | අස් වූ දිනය | සමත් කළ ප්‍රසිද්ධ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | | | |

9. ඔබ පාසැලේදී ලැබූ ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨතාවයන් :————.
10. ඔබ විසින් පාසැලේදී ලැබූ වෙනත් සැලකිලිමත් ජයග්‍රහණ :————.
11. ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකායේ, බාලදක්ෂ ව්‍යාපාර, ශ්‍රී ලංකා ස්වේච්ඡා බල හමුදව යනාදි ස්වේච්ඡා සංවිධානවල කළ සේවය :————.
12. කිසියම් සන්නද්ධ සේවාවකට කලින් ඉල්ලුම් කර ඇත්නම්, එහි ප්‍රතිඵලය දක්වන්න :————.
13. පාසැලෙන් අස්වූ තැන් පටන් කළ රැකියාව :————.
14. චරිත සහතික දුන් පුද්ගලයාගේ නම සහ ලිපිනයන් :—
   (අ) :————.
   (ආ) :————.
15. වෙනත් අදල කරුණු :————.

ඉහත දක්වෙන ප්‍රකාශයන්ට මවිසින් සපයන ලද පිළිතුරු මගේ දනීමේ හැටියට සත්‍ය බැව් ගෞරව පූර්වකව ප්‍රකාශ කර සිටිමි. යුද්ධ හමුද ශිෂ්‍යභට නිලධාරි තනතුරු සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට බලපාන සේවා කොන්දේසි මෙන්ම නිලධාරින්ට බලපාන වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කර ඇති පරිදි ම විසින් කියවා ඇති අතර එය මම අවබෝධ කර ගතිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

### ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (මහජන මත්ස්‍යාගාරය හා පර්යේෂණ) තනතුර

ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ (මහජන මත්ස්‍යාගාර හා පර්යේෂණ) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, 1973 මාර්තු 6 වැනි දිනට හෝ ඊට පෙර, "ලේකම්, නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය, 54, චැතැම් වීදිය, කොළඹ 1" වෙත ලේඛණගත තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. කවරේ උඩ වම් කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ තනතුර (මහජන මත්ස්‍යාගාරය හා පර්යේෂණ)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—** (අ) තනතුර ස්ථිරය, රජයේ අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) සත්වෝද්‍යානය තුළ නිල නිවාසයක් වෙන්කර දුන් පසුව, තෝරා ගනු ලබන තැනැත්තා එහි පදිංචි විය යුතු අතර, ඕනෑම අවස්ථාවක සේවය සඳහා සූදානම්ව සිටිය යුතුය. මුදල් රෙගුලාසි අනුව ඔහු විසින් ගෙවල් කුලී ගෙවිය යුතුය.

3. **වැටුප් පරිමාණය.—** වර්ෂයකට රු. 6,720 න් පටන් ගෙන රු. 360 වාර්ෂික වැටුප් වර්ධක 12 කින් හා වර්ෂයකට රු. 480 බැගින් වාර්ෂික වැටුප් වර්ධක 5 කින් රු.13,440 දක්වා වැඩිවන ඒකාබද්ධ වැටුපක් මේ තනතුරට අයිතිය. (69. 10. 1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4,080—12×360 සහ 5×480—10,800 වේ.) වර්ෂයකට රු. 11,040 ඒකාබද්ධ වැටුප් පියවර ඉක්මවා යෑමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.—** සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව.

(ආ) 1973 මාර්තු 6 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව බලපවත්වන්නේ නැත.)

(ඇ) (i) කරදිය ජීව විද්‍යාව විශේෂ විෂයයක් වශයෙන් ද, රසායන විද්‍යාව උපකාරි විෂයයක් වශයෙන් ද ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයක සත්ව විද්‍යා උපාධිධාරියෙකු බව,

**එසේ නැතහොත්**

(ii) ජීව විද්‍යාව, සත්ව විද්‍යාව හා රසායන විද්‍යාව ඇතුළුව (පළමුවැනි හෝ දෙවැනි පංතියේ) සාමාන්‍ය උපාධියක් ලබා ඇති බව.

**සටහන.—** සාමාන්‍ය පරිපාලන හා සැකසීමේ හැකියාවක්, ක්ෂේත්‍ර රාජකාරී කෙරෙහි ඇති ඇල්මක්, කරදිය සහ මිරිදිය මත්ස්‍යන් පිළිබඳ දැනුමක් හා ඒ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමට උනන්දුවක් ද දක්වන අය ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම්පත්වලට ඇමිනිය යුතුවේ:—

(i) උප්පැන්න සහතිකය.

(ii) මෑතකදී ලබාගත් චරිත සහතික 3 ක් (රජයේ සේවයේ යෙදී සිටින අයට අදාල නොවේ.)

(iii) උසස්ම අධ්‍යාපනික/සහ වෘත්තීය සහතික.

(iv) සාමාන්‍ය පරිපාලනය, සැකසුම් හැකියාව සහ ක්ෂේත්‍ර රාජකාරි හා පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් අයදුම්කරුගේ පළපුරුදුකම් පිළිබඳ විස්තර සඳහන් වන අත්සන් කරන ලද වාර්තාවක් සමග එම විස්තර තහවුරු කරන සහතිකවල පිටපත්.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නො ලැබේ. එහෙත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවසානයේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ වෙනයම් ලියකියවිලි, නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට හැර මෙම අමාත්‍යාංශයේ හෝ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වෙනත් කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අපේක්ෂකයින්ගේ අවධානය යොමුකරවනු ලැබේ.

9. අයදුම්පත් ලැබුණු බව අයදුම්කරුවන්ට දන්වනු ඇත.

පී. බී. කරඳවල,
ලේකම්,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 5 දින,
කොළඹ 1,
චැතැම් වීදියේ,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ආකෘතිය

**ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යානයේ සහකාර අධ්‍යක්ෂ (මත්ස්‍යාගාරය හා පර්යේෂණ) තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම :———.

2. ලිපිනය :———.

3. උපන් දිනය හා උපන් ස්ථානය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. ජාතිය :———.

5. විවාහකද අවිවාහකද යන බව :———.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :———.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ අභ්‍යාස පිළිබඳ විස්තර :———.
(මේ සම්බන්ධයෙන් ලත් සහතිකවල පිටපත් අයදුම්පතට යාකළ යුතුය)

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම්, එයින් අස්වීමට හේතුව :———.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරුවකුවී ඇත්නම්, එම වරද හා දඬුවම පිළිබඳ විස්තර :———.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදවි නාම :———.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

2–585—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

### බාජ් යාත්‍රා ප්‍රධානියකුගේ තනතුර

කොළඹ වරාය කොමිෂන් සභාවේ බාජ් යාත්‍රා ප්‍රධානියකුගේ තනතුරු එකක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝර්මයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1973.03.08 වැනි දින හෝ එයට පෙර මෙම කාර්යාලය වෙත ලැබිය යුතුය.

2. වැටුප් දීමනාවන් හා සේවා කොන්දේසි :

මෙම තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රුපියල් 4,296—144—5,880 වේ. තෝරාපත්කරගනු ලබන අපේක්ෂකයා නියමිත වැටුප් ක්‍රමයේ යෝග්‍ය වැටුප් පියවරක් මත තබනු ලැබේ.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර හා අර්ථ සාධක අරමුදල් පදනම මත වනු ඇත. තෝරා පත්කරගනු ලබන්නාගේ පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට භාජනය කරනු ලැබේ. එහෙත් 1971 දෙසැම්බර් 31 වැනි දින විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයක සිටි **රාජ්‍ය සේවකයෙකු තෝරා ගතහොත් ඔහු පළමුවෙන්** අළුත් තනතුරේ අවුරුදු 1 ක කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු කෙටි දැනුම් දීමකින් සේවයේ වැඩ භාර ගැනීමට සූදානම්ව සිටිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙකු විසින් ඔප්පු කළ යුතුය.

(i) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 සහ 45 අතර විය යුතුයි.

(ii) යටත් පිරිසෙයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටිය යුතුය.

(iii) සමුද්‍ර යාත්‍රා වෘත්තීය පිළිබඳව මේට් හෝ මාස්ටර් සහතිකයක් ලබා සිටිය යුතුය. මේට් වරුන්ගේ පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අයැදුම්කළ අයගෙන් අයදුම්පත් භාරගනු ලැබේ. එහෙත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී ඔවුන්ට මේට් වරුන්ගේ සහතිකය තිබිය යුතුය. ටොන් 1500 ට අඩු වෙරළ අවට යාත්‍රා කරන ජල යාත්‍රාවල මේට් වරුන්ගේ ප්‍රවීණතාවය පිළිබඳ සහතිකය සඳහා පරීක්ෂණ යට. අදාල නීතිරීති වරාය කොමිෂමේ (කොළඹ 1) මාස්ටර් **ඇටෙන්ඩන්ට්ගෙන් ඉල්ලා ලබාගත හැක.**

**සැලකිය යුත්තක් :**

සිවිල් ඉංජිනේරු ගොඩනැගිලි හා නඩත්තු වැඩ, **විශේෂයෙන්** සමුද්‍ර නාවික වැඩ ගැන දැනීම අතිරේක සුදුසුකමක් හැටියට සැලකේ.

5. **තනතුරට නියමිත රාජකාරි**

(අ) මුහුදු නිර්මාණ අධිකාරි අංශයේ ඇති සියලුම පාවෙන යාත්‍රා නඩත්තුව, බෙදාහැරීම හා පාලනය.

(ආ) වේදිකා බිත්තියෙහි වූ සියලුම යාත්‍රා වලට බඩු පැටවීම පාලනය කිරීම.

(ඉ) සින්කර් වර්ගයේ කුඩා යාත්‍රා බැඳ තබන ස්ථාන නඩත්තු කිරීම.

(ඊ) තමාහට පවරන ලද "ශ්‍රැබ් ඩ්‍රෙජරයෙන්" මඩ හැරීම පරිපාලනය කිරීම වැනි වෙනත් කවර රාජකාරියක් හෝ.

6. ඉල්ලුම් පත්‍රය හෝ තනතුර පිළිබඳ වෙනත් කවර අන්දමේ හෝ ලියුම් කොළඹ වරාය කොමිෂන් සභාවේ වරාය කොමසාරිස් වරයා වෙත එවිය යුතු අතර, පෞද්ගලික වශයෙන් දෙපාර්තමේන්තුවේ කවර නිලධාරියෙකු වෙත නොඑවිය යුතුය. පෞද්ගලික ලිපිනයන්ට එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. චරිතය හා යෝග්‍යතාවයන් දක්වන සහතික පිටපත් 3 ක් **යටත් පිරිසෙයින් ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට අමුණා** එවිය යුතුය.

8. ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වනු නොලැබේ.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන කාණ්ඩ ආරම්භයේ ඇති රජයේ සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලන්න.

ඊ. ජේ. වීරරත්න,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂම,
කොළඹ 1, 1973.02.06.

**ආදර්ශ ඉල්ලුම් පත්‍ර පෝරමය**

**කොළඹ වරාය කොමිෂන් සභාව—බාජ් යාත්‍රා ප්‍රධානියෙකුගේ තනතුර**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————.

(4) ලබා ඇති උසස්ම ශාස්ත්‍රීය සුදුසුකම් :————.

(5) නාවික යාත්‍රා වෘත්තීය පිළිබඳ මේට් හෝ මාස්ටර් සහතිකය ලබා ඇත්තේ ද ?

(6) සිවිල් ඉංජිනේරු ගොඩබිම් හා නඩත්තුව හා නාවික වැඩ පිළිබඳව පළපුරුද්දක් ඇත්තේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

(7) සහතික ලබා ඇති අයගේ නම් සහ තනතුරු :————.

(8) වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :————.

(9) පහත සඳහන් ලියවිලිවල පිටපත් අමුනා ඇත :—

(අ) උප්පැන්න සහතිකය :————.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනය පිළිබඳ සහතිකය : ————.

(ඉ) නාවික යාත්‍රා වෘත්තීය පිළිබඳ මේට් හෝ මාස්ටර් සහතිකය :————.

(ඊ) අළුත්ම චරිත සහතික තුනක් :————.

ඉහත දැක්වෙන විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–608—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි තනතුර (සමුපකාර හා ණය)

ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා ලංකාවේ පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ ලියකියවිලි සහිතව, මෙම ආයතනයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ විස්තර සඳහන් කර අධ්‍යක්ෂ, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 33, එළිබෑන්ක් පාර, කොළඹ 5 යන ලිපිනයට 1973.03.06 දිනට ප්‍රථම ලැබෙන පරිදි ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ උඩ සඳහන් කළ යුතුය.

1. **සුදුසුකම් :**

(i) (අ) පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි (සමුපකාර හා ණය).—ආර්ථික විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, කෘෂිකර්ම අර්ථ ශාස්ත්‍රය, වානිජ විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ I පන්තියේ හෝ II වන පන්තියේ (උසස් පෙළ) උපාධිධාරියෙකු විය යුතුය ; හෝ

ඉහත සඳහන් විෂයය එකක් හෝ වැඩි ගණනක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක්, සමුපකාර ව්‍යාපාරය හා ග්‍රාමීය ණය ක්‍රමය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

(ii) විධායක පළපුරුද්ද සහ ක්ෂේත්‍ර පළපුරුද්ද මෙම තනතුර සඳහා අමතර සුදුසුකමක් වේ. අයදුම්කරුවන් විසින් අදාළ ක්ෂේත්‍රය පිළිබඳව තමන්ගේ සුදුසුකම් දැක්වීමට කැමැත්තේ නම්, තම ප්‍රකාශනවල පිටපත් හෝ ටයිප් කරන ලද අත් පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඒවා පරීක්ෂා කිරීමෙන් පසුව ආපසු එවනු ලැබේ.

(iii) රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ආයතනවල නිලධාරීන් ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලන්නේ ඔවුන් යටත් පිරිසෙයින් අදාළ විෂයෙහි වර්ෂ 8 ක පළපුරුද්දක් ඇත්නම් පමණයි.

(iv) **වයස.**—ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරුවන්ගේ වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය. මෙය රජයේ දෙපාර්තමේන්තු, **සංස්ථා හා ආයතනවල සේවකයින්ට බලපාන්නේ නැත.**

2. වැටුප්.—පහත සඳහන් වැටුප් ක්‍රමය ඇති ශ්‍රේණි 3 ක් වනු ඇත :—

I ශ්‍රේණිය—රු. 1,500—6×75—රු. 1,950

II ශ්‍රේණිය—රු. 1,200—5×60—රු. 1,500

**III ශ්‍රේණිය—රු. 700—5×40, 5×50 රු. 1,150. රු. 900 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි.**

(ii) ඉල්ලුම්කරුවන් බඳවාගනු ලබන්නේ 3 වෙනි ශ්‍රේණියටයි. විශේෂ අවස්ථාවල අයදුම්කරුවන්ගේ විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ඉහත සඳහන් වැටුප් පරිමාණයෙහි සුදුසු ස්ථානයක තැබීම ගැන සලකා බලනු ලැබේ.

(iii) (අ) මෙම ආයතනයට වටිනාකමක් ඇති හා අදාළ වූ පර්යේෂණ ප්‍රකාශණයට පත් කිරීම.

(ආ) පුහුණු කිරීම සම්බන්ධයෙන් වැඩ කොටසක් ඉටු වීම.

(ඇ) අන්තර් ජාතීය කාර්යමණ්ඩලයක් සමඟ ක්‍රියා කිරීමේ දක්ෂතාවය.

III ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රථම මේ කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් ක්‍රියා කළ යුතුය.

(iv) III ශ්‍රේණියේ නිලධාරියෙක් පහත සඳහන් කරුණු අතරින් එකක් සම්පූර්ණ කිරීමෙන් II වෙනි ශ්‍රේණියට සමත්වීමට සුදුසුකම් ලබයි.

1. අදාළ විෂයෙහි පශ්චාත් උපාධියක් ලබා ගැනීම. (පශ්චාත් උපාධියක් ඇතිව ආයතනයකට බැඳෙන අයදුම්කරුවන් අදාළ විෂයෙහි කළ පර්යේෂණ ප්‍රකාශණ ඉදිරිපත් කළ යුතුය.)

2. පර්යේෂණ ප්‍රකාශණ (කාර්යක්ෂමතා කඩඉම සමත් වීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රකාශන මේ සඳහා සලකා බලනු නො ලැබේ.

3. පුහුණුවීම සම්බන්ධයෙන් කරන ලද වැඩ කොටස.

(v) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් වීමට සුදුසු වනුයේ, නිලධාරියාගේ වැඩ සහ හැසිරීම I ශ්‍රේණියට උසස් කිරීමට තරම් සුදුසු වන්නේ යයි පාලක මණ්ඩලය සෑහීමට පත්වුවහොත් පමණි.

3. **සේවා කොන්දේසි.**—තෝරාගත් අයදුම්කරුවන්—

(අ) වර්ෂ 2 ක ආධුනික තත්වයේ සිටිනු ඇත. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා හා ආයතනවල ස්ථිර නිලධාරීන් වශයෙන් තුළ වැඩ බලනු ඇත.

(ආ) **1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ රෙගුලාසිවලට හා** දැනට පනවා ඇති හෝ අනාගතයේ දී රජය විසින් පැනවීමට හැකි රාජ්‍ය භාෂා රෙගුලාසිවලට යටත් විය යුතුය.

(ඇ) විදේශීය විශේෂඥයින්ගේ අනුරූපක නිලධාරීන් වශයෙන් ක්‍රියා කළ යුතු අතර අන්තර් ජාතික කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමේ හැකියාවක් තිබිය යුතුය.

(ඈ) ලංකාවේ ඕනෑම පළාතක ක්ෂේත්‍ර වැඩ කිරීමට සූදානම් විය යුතුය.

(ඉ) **ජාතික සුභසාධක අරමුදලට මුදල් ගෙවිය යුතු අතර, 1972** අංක 5 දරණ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ පනත යටතේ දැනට පනවා ඇති හා අනාගතයේ දී පැනවිය හැකි රෙගුලාසිවලට යටත් විය යුතුය.

4. **සාමාන්‍ය කොන්දේසි :**

1. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) පිළිගත් පුද්ගලයන් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක් ; ඉන් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ/ආචාර්ය/මහාචාර්ය තැනකගෙන් විය යුතුය.

(ඇ) ලබාගත් ඉහළම අධ්‍යාපන සහතික.

(ඈ) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි විෂයවලින් සමත් වූ ඉහළම විභාගය පිළිබඳ සහතිකය.

2. ඉල්ලුම්පත් ලැබුණු බවට දැනුම්දීමක් නොකරනු ඇත. මෙම දැන්වීමේ අවශ්‍යතාවලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. අවශ්‍ය වූ විට ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නො ලැබේ.

3. කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට අයදුම්කරුවන් කැඳවනු ඇත. ගමන් වියදම් හෝ වෙනත් වියදම් නො ගෙවනු ඇත.

4. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයක් හා සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව ඔප්පු කළ යුතුය.

5. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් හැර සෙසු තෝරාගත් අපේක්ෂකයින් රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් කරනු ලබන ලංකාවේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු බව පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය පරීක්ෂණයකට යටත් විය යුතුය.

6. රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු ලබන්නේ මෙම තනතුරට තෝරාගතහොත් මුදා හැරීමට සූදානම් බවට නිර්දේශයක් සහිතව දෙපාර්තමේන්තු/සංස්ථා/ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කළහොත් පමණි.

අධ්‍යක්ෂ,
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

02–580—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### රෝහල්හි II වැනි ශ්‍රේණියේ වෛද්‍ය අධිකාරී තනතුරු

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ රෝහල්හි II වැනි ශ්‍රේණියේ වෛද්‍ය අධිකාරී තනතුරු සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම්පත්‍ර : 1973 මාර්තු මස 9 වැනි ද

(බී) විදේශීය ඉල්ලුම්පත්‍ර : 1973 මාර්තු මස 16 වැනි ද

**සටහන්.**—(1) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයැදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(II) පිටරටවල අයැදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළතදී බාරදීමට අයැදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(III) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය කරනු සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරින්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි.**—(I) මෙම තනතුර ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(II) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නො ලැබේ.

(III) තෝරාගත් අයැදුම්කරු පත්වීම ස්ථිර කිරීමට පෙර පාලන රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා ආරෝග්‍යශාලා පාලනය හා සිංහල/දෙමළ භාෂාව පිළිබඳ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණය නම් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සඳහා පැවැත්වෙන පරීක්ෂණයකි.

මෙම පරීක්ෂණය සමත්වීමට අපොහොනත් වුවහොත් ආයතන සංග්‍රහයේ II වෙනි පරිච්ඡෙදයේ 9:6, 9:7 හා 9:8 ඡෙදයන්හි රෙගුලාසි අදාලවනු ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. රු. 11,520 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතව, වර්ෂයකට රු. 9,600—360×4 හා 480×7—රු. 14,400 කි. වර්ෂයකට රු. 11,520 කට පෙර කාර්යක්ෂමතා කඩඉම වැඩ සහ හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දෙනු ලබන සහතිකයකින් සමන්විතය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(බී) **1973 පෙබරවාරි මස 15 දිනට අවුරුදු 33 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරින් කෙරේ බලපාන්නේ නැත).**

(සී) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක ඩිප්ලෝමා සහතිකයක් ඇති බව,

(ඩී) රජයේ ආයුර්වේද ආරෝග්‍යශාලාවක වෛද්‍යවරයෙකු වශයෙන් අවුරුදු 10 කට නො අඩු පළපුරුද්දක් ඇති බව
හෝ,

සාමාන්‍ය ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් අවුරුදු 15 කට නො අඩු පළපුරුද්ද ඇති බව.

(ඊ) පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පරියේෂණ හෝ නොයෙකුත් ප්‍රකාශණ පළකිරීමෙන් ලත් විශිෂ්ඨ කීර්තිය ඇති බව,

සටහන.—පරිපාලන පළපුරුද්ද ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය.

(ඒ) උප්පැන්න සහතිකය, (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නො ලැබේ).

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්‍ය්‍යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතිකය.

සැ.යු.—(I) අයැදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(II) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයැදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටස (II) වන ඡෙදය ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ඊ. එස්. වීරතුංග,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 5 දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්‍ය්‍යාලයේ දී ය.

අංකය : ..............................................
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

සෞඛ්‍ය අමාත්‍යාංශය

ඉල්ලුම් පත්‍ර පෝරමය

1. ඉල්ලුම් කරන තනතුර;
..................................................................................................තනතුර
..................................................................................................දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| 2. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) | |
| 3. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහාම දන්වාමිදිය යුතුය) | |
| 4. උපන් දිනය<br>වර්ෂය මාසය දිනය<br>......... ......... ......... | 6. ඔබ ලංකා රටවැසියෙක්ද ? පාරම්පරික රටවැසියෙක්ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක්ද යන බව සඳහන් කරන්න. (සටහන අංක (1) බලන්න) |
| 5. දේශීය ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය වන විට නියම වයස :<br>වර්ෂ මාස දින<br>......... ......... ......... | 7. උපන් ස්ථානය (සටහන අංක (2) බලන්න)<br>(අ) ඉල්ලුම්කරුගේ : ..............................<br>(ආ) පියාගේ : ..............................<br>(ඇ) පිය පාර්ශ්වයේ මුත්තාගේ : ..............................<br>(ඈ) පිය පාර්ශ්වයේ මී මුත්තාගේ : .............................. |
| 8. (අ) ස්ත්‍රී පුරුෂ භාවය : ..............................<br>(ආ) ඔබ විවාහකද ? අවිවාහකද ? වැන්දඹුවෙක්ද, වැන්දඹුවකද යන බව.............................. | 9. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය<br>(1) සිංහල (2) දෙමළ (3) ඉංග්‍රිසි<br>(1) ..............................<br>(2) ..............................<br>(3) .............................. |

10. වයස අවුරුදු 12 න් පසු ඉගෙනීම ලැබූ පාඨශාලා සහ වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) ........ | ........ | ........ | (1) ........ | ........ | ........ |
| (2) ........ | ........ | ........ | (2) ........ | ........ | ........ |
| (3) ........ | ........ | ........ | (3) ........ | ........ | ........ |
| (4) ........ | ........ | ........ | (4) ........ | ........ | ........ |

11. ක්‍රීඩා පිළිබඳව ලබා ඇති විශිෂ්ඨත්ව පිළිබඳ විස්තර සහ ඒ අංශයෙහි ඔබ විසින් උසුලන ලද වගකිවයුතු පදවි පිළිබඳ විස්තර :—

12. (එ) ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේද ? ණය ගැතිව සිටින්නේ නම් ඒ කොපමණකටද?

(බී) ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක්ද? එසේ නම්, දිනයන් සහ නඩු අංකය සමඟ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :—

13. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබාගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ඨ සමර්ථ වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පංතියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබාගත් ආයතනවල නම් සඳහන් කරන්න :—

14. දැනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථමයෙන් කරන ලද රක්ෂාවල් :
(රක්ෂාවට බැඳුනු දිනය, ඉන් අස් වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වැටුප සඳහන් කරන්න)
සැලකිය යුතුයි.—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි පහළ 16 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුය.

| | පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|---|
| (1) | ........ | ........ | ........ | ........ |
| (2) | ........ | ........ | ........ | ........ |
| (3) | ........ | ........ | ........ | ........ |
| (4) | ........ | ........ | ........ | ........ |
| (5) | ........ | ........ | ........ | ........ |
| (6) | ........ | ........ | ........ | ........ |
| (7) | ........ | ........ | ........ | ........ |
| (8) | ........ | ........ | ........ | ........ |

15. විශේෂ සුදුසුකම්.—දැන්වීමෙහි දක්වෙන විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට ඇත්තේද ? එසේ ඇතහොත් දිනයන්ද ඇතුළුව ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න. විශේෂ සුදුසුකම් කිසිවක් නියම කොට ඇද්දැයි ගැසට් නිවේදනය බලන්න)

16. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :—

17. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත්කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

..............................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය..............................

සටහන්.—(1) ඔබ ලංකාවේ රට වැසියකු වී සිටින්නේ ලියාපදිංචි වීමෙන් නම්, ඔබට නිකුත් කරන ලද රටවැසි සහතිකයේ යොමු අංකය සහ දිනය සඳහන් කරන්න.

(2) ඉල්ලුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) වලට අතිරේක වශයෙන් (ආ) හෝ (ඇ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු/ඇ උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) වලට අතිරේකව (ආ) සහ (ඇ) හෝ (ඈ) හෝ පිරවිය යුතුයි.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම්, ඔහු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :—

..............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය:—————

02-658—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

### සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව

### පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යාව) තනතුර

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යාව) තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගනු ලබන අයදුම්පත් 1973 මාර්තු මස 10 දින හෝ එදිනට කලින් හෝ කොළඹ 1, තැ.පෙ. 1652, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

සටහන.—(1) ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(2) අයදුම්පත් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසියම් පැමිණිල්ලක් ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දින කිපය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අපේක්ෂකයන් විසින්ම විඳ දරා ගත යුතුය.

2. සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ක හා කොන්දේසි.—(1) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් රහිත ය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත්කරනු ලබත්.

(2) තෝරා ගනු ලබන අයදුම්කරුවෙකු 1972 ජනවාරි 1 වන දිනට පෙර රජය යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් දරන්නෙකු නම්, ඔහු පළමු කොට නිශ්චිත කාල පරිච්ඡෙදයක් සඳහා වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

3. වැටුප් හා දීමනා.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය. වර්ෂයකට රු. 7,440—10 × 360 හා 11 × 480—රු. 16,320 (රු. 11,520 හා රු. 14,880 පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.)

සටහන.—(I) නියමිත පශ්චාත් උපාධියකින් සමත් නොවුවහොත් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 11,520 පියවරින් ඔබ්බට යාමට කිසිම නිලධාරියෙකුට හිමිකමක් නැත.

(II) නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරණ අයදුම්කරුවකු ඉහත වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 8,520 වැටුප් පියවරේ තබනු ඇත.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අපේක්ෂකයෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව පිළිබඳ පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ ගෞරව උපාධියක් තිබිය යුතුය;

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳව පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

සටහන.—පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ—

(I) උපාධි පරීක්ෂණයේ දී උද්භිද විද්‍යාව උප විෂයයක් වශයෙන් සමත්ව ඇති අය;

(II) කෘෂිකර්මය පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති අය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 30 නොවැඩි විය යුතුය. පශ්චාත් උපාධිධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස අවුරුදු 35 ක් වේ. (දනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(ඈ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

5. පහත සඳහන් ලියවිලිවලින් කීපයක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය—

(අ) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය :

සැලකිය යුතුයි.—බවුතීස්ම සහතිකය හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි ආධාර ලබන පාඨශාලාවන්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතිකය හෝ භාරගනු නොලැබේ.

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්; මෙයින් එකක් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යක්ෂක ගෙන් විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර.

(ඉ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සටහන.—(1) අයදුම්පත්වලට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.

(2) ඉල්ලූ අවස්ථාවකදී ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින් ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංයුක්ත මණ්ඩල ප්‍රධානියා මුගින් එවිය යුතුය.

7. ඉල්ලුම්පත්‍ර හා ඒ හා සම්බන්ධ අනෙකුත් ඕනෑම ලියවිල්ලක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත මිස, මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. ගැසට් පත්‍රයේ I වැනි කොටස: (II අ) වැනි ඡෙදය ආරම්භයෙහි සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

ඩොරික් ද සූසා,
ලේකම්,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 6 වැනි දින,
6, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
තැ.පෙ. 1652,
කොළඹ 1.

### ආදර්ශ අයදුම් පත්‍රය

සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරි (රසායන විද්‍යාව) තනතුර සඳහා අයදුම් පත්‍රය

(අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නො ඇමිණිය යුතුය.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. තැපැල් ලිපිනය (ලිපිනයෙහි වෙනසක් වුවහොත් එය වහා දැනුම් දිය යුතුය.) :————.

3. (අ) උපන් දිනය :—
වර්ෂය :————, මාසය :————, දිනය :————.
(ආ) ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන විට නියම වයස :—
වර්ෂ :————, මාස :————, දින :————.

4. ඔබ ලංකා රටවැසියෙක් ද? පාරම්පරික රටවැසියෙක් ද? එසේ නැතහොත් ලියාපදිංචි වූ රටවැසියෙක් ද යන බව සඳහන් කරන්න (ලියාපදිංචි වූ රටවැසියෙක් නම් සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.) ————.

5. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) පියාගේ :————.
(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ :————.
(ඈ) පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

6. (අ) ස්ත්‍රී පුරුෂ භාවය :————.
(ආ) ඔබ විවාහක ද, අවිවාහක ද, වැන්දඹුවක් ද යන බව :————

7. සාමාර්ථය ලබා ඇති ඉහළම විභාගය :—
(1) සිංහල :————.
(2) දෙමළ :————.
(3) ඉංග්‍රීසි :————.

8. වයස අවුරුදු 12 න් පසුව ඉගෙනීම ලැබූ පාඨශාලා, විද්‍යාල හා වෙනත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| (1) ............ | ........ | ........ | (1) ............ | ........ | ........ |
| (2) ............ | ........ | ........ | (2) ............ | ........ | ........ |

9. ඔබ ණයගැති භාවයෙන් මිදී සිටින්නේ ද? ණයගැතිව සිටින්නේ නම් ඒ කොපමණකට ද? :————.

10. ඔබ සාපරාධී වරදකට උසාවියක දී චෝදනා ලැබුවෙක් ද? එසේ නම් දිනයන් සහ නඩු අංකය සමග සම්පූර්ණ විස්තර සඳහන් කරන්න ————.

11. අධ්‍යාපන, වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, ඒවායේ දින, පන්තියක් වේ නම් එය, ඒවා සඳහා ගන්නා ලද විෂයයන් සහ ඒවා ලබා ගත් ආයතනවල නම් සඳහන් කරන්න.) :————.

12. දනට නිරත රක්ෂාව හා ඊට ප්‍රථම කරන ලද රක්ෂාවන් (රක්ෂාවට බැඳුන දිනය, ඉන් අස්වූ දිනය හා අන්තිමට ලැබූ වාර්ෂික වේතනය සඳහන් කරන්න.) :—

| පදවිය | සිට | දක්වා | වාර්ෂික වැටුප රුපියල් |
|---|---|---|---|
| (1) ............ | ...... | ...... | ............ |
| (2) ............ | ...... | ...... | ............ |

**සැලකිය යුතුයි.**—ආණ්ඩුව යටතේ කළ සේවය අවසන් වීමට හේතුව මෙහි 13 වැනි කොටුවෙහි සඳහන් කළ යුතුයි.

13. තවත් තොරතුරු කිසිවක් වේ නම් ඒවා :————.

14. ඔබ ගැන තොරතුරු විමසිය යුතු බව හොඳට දන්නා හඳුනන පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්න :—
(1) :————.
(2) :————.

15. මෙම ඉල්ලුම් පත්‍රයෙහි මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස්සකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගත හොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–605—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කාර්යක්ෂමතා කඩඉම සඳහා වූ ගුරුවරුන්ගේ චිත්‍රකර්ම උසස් විභාගය—1972**

1957 II වැනි සැසි වාර්තාව වශයෙන් නිකුත් වී ඇති වැටුප් විෂමතා කොමිෂන් සභා වාර්තාවේ 77 හා 242 වැනි ඡේද හා 1967 වැටුප් විෂමතා කමිටු නිර්දේශ අනුව 1972 අගෝස්තු මස පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම සඳහා වූ ගුරුවරුන් ගේ චිත්‍රකර්ම උසස් විභාගයෙන් පහත සඳහන් ගුරුවරුන් සම්පූර්ණ සාමාර්ථය ලබා ඇති අතර, ඔවුන්ගේ කාර්යක්ෂමතා කඩඉමෙන් එතර වීමට සුදුසුකම් ලබා සිටී. මේ සාමාර්ථය වලංගු වන්නේ 72.8.16 දින සිට ය.

II කොටස—ලිඛිත පරීක්ෂණයෙන් පමණක් සමර්ථ වී ඇති අය සම්පූර්ණ සාමාර්ථය සඳහා ප්‍රායෝගික I කොටසට නැවත පෙනී සිටිය යුතු ය.

ලිඛිත හා ප්‍රායෝගික යන පරීක්ෂණ දෙකින් ම සාමාර්ථය ලබා ගත් අය

| ගුරුවරයාගේ නම | | සේවය කළ විදුහල |
|---|---|---|
| **සිංහල මාධ්‍ය** | | |
| 1. ගජනායක, එච්. | ... | මාර/දික්වැල්ල උතුර ම. වි. |
| 2. ගලහිටියාව, ආර්. ඩබ්. | ... | නු/කීර්ති බණ්ඩාර ම. වි. |
| 3. ගමගේ, කේ. ජේ. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 4. ගුණවර්ධන, ඒ. පී. එම්. ද වාස් | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 5. ජයසිංහ, යූ. ඊ. | ... | ක/අලුබෝමුල්ල ම. වි. |
| 6. ජයසිංහ, ජී. එස්. එම්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 7. පෙරේරා, යූ. එල්. එච්. ඊ. | ... | කොළ/උදම්මිට ම. වි., කොටුගොඩ. |
| 8. පෙරේරා, බී. එම්. ආර්. එෆ්. | | කොළ/නිව්ස්ටඩ් බාලිකා ම. වි., මීගමුව. |
| 9. ප්‍රේමපාල, එල්. ජී. | ... | මහ/වික්‍රමබාහු ම. ම. වි., ගම්පොල. |
| 10. ප්‍රේමරත්න, ඒ. එල්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 11. රුද්‍රිගු, ඩබ්. ඒ. එල්. සී. | ... | කොළ/නිමල මරිය බාලිකා ම. වි., තුඩැල්ල, ජාඇල. |
| 12. සෙල්ලහේවා, එස්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 13. සිල්වා, ඒ. ඒ. ට්. | ... | කොළ/කඳාන රෝ. ක. බාලිකා වි, කඳාන. |
| 14. උල්ලුවිස්හේවා, පී. | ... | මාර/තලල්ල ම. වි., කෝට්ටේගොඩ. |
| 15. වීරසිංහ, ඩබ්. ඒ. ඩබ්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 16. විජේසිංහ, ඒ. | ... | ත/රාජපක්ෂ ම. ම. වි., වීරකැටිය. |
| **දෙමළ මාධ්‍ය** | | |
| 17. තම්බිරත්නම්, | .. | යා/රාමනාදන් වි., චුන්නාකම්. |
| **ඉංග්‍රීසි මාධ්‍ය** | | |
| 18. අලගරත්නම්, ට්. | ... | කොළ/යහපත් එඬේරාගේ කන්‍යාරාම වි., වත්තල. |

| ගුරුවරයාගේ නම | | සේවය කළ විදුහල |
|---|---|---|
| 19. අලහේන්ද්‍ර, සී. ආර්. | ... | කොළ/නාලන්දා ම. ම. බා. වි., මිනුවන්ගොඩ. |
| 20. අතුකෝරාලේ, ඒ. සී. එන්. එන්. | ... | කොළ/වත්තල සාන්ත ආනා බා. ම. වි., වත්තල. |
| 21. ධර්මරාජා, එම්. එස්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 22. ප්‍රනාන්දු, ට්. පී. එල්. | ... | කොළ/මෙතෝදිස්ත උසස් වි., මොරටුමුල්ල, මොරටුව. |
| 23. මාවලගෙදර, ආර්. බී. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 24. පෙරේරා, ඒ. එස්. | | බ/බදුල්ල ම. වි., බදුල්ල. |
| 25. පොන්වීර, ආර්. | ... | කොළ/ශා. සෙබස්තියන් බා. වි., කඳාන. |
| 26. සමරසේකර, ඩබ්. | ... | මහ/ශා. ස්කොලස්ටිකා ම. වි, මහනුවර. |
| 27. වික්‍රමසිංහ, සී. ඒ. | ... | මහ/කිංස්වුඩ් වි., මහනුවර. |
| 28. විජේගුණරත්න, කේ. වී. ඩී. එස්. පී. | ... | හෝ/මායාදුන්න ම. වි., හංවැල්ල. |
| 29. කන්දසාමි, එන්. එස්. | ... | යා/පලාලි ගුරු අභ්‍යාස වි., වාස විලාන්. |
| 30. සෙල්වනායගම්, ට්. | .. | යා/පලාලි ගුරු අභ්‍යාස වි., වාස විලාන්. |
| 31. කනගසභාපති, එස්. | ... | යා/හින්දු වි., යාපනය. |

ලිඛිත පරීක්ෂණයෙන් පමණක් සමත් වී ඇති අය

| | | |
|---|---|---|
| **සිංහල මාධ්‍ය** | | |
| 1. ඩයස්, එම්. ඒ. එස්. | ... | කොළ/යසෝදරා දේවී වි. |
| 2. පෙරේරා, එම්. කේ. | ... | හෝ/ශ්‍රී සිද්ධාර්ථ ම. වි., කලපලුවාව, රාජගිරිය. |
| 3. පියදාස, වයි. | ... | කු/මිතැන්වල ම. වි., මාවතගම. |
| 4. රත්නායක, ආර්. එම්. එස්. | ... | මහ/ගිරාගම සෞන්දර්ය අභ්‍යාස වි., පිළිමතලාව. |
| 5. වීරනායක, පී. ඒ. වයි. | ... | කොළ/මත්තුමගල ම. වි., රාගම. |
| **ඉංග්‍රීසි මාධ්‍ය** | | |
| 6. රාජපක්ෂ, එල්. ට්. | ... | කොළ/වත්තල ශා. අන්තෝනි ම. වි., වත්තල. |
| 7. විජයනායක, පී. | .. | අ/මහාබෝධි වි., අනුරාධපුරය |
| 8. සෝමසුන්දරම්, කේ. | ... | යා/හින්දු විද්‍යාලය, යාපනය. |

ප්‍රේමදාස උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 පෙබරවාරි මස දින,
කොළඹ 2,
අධ්‍යාපන අමාත්‍යාංශයේ
පාසල් පරිපාලන ශාඛාවේ දීය.
පාප/3/1378.

2–581—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ආරෝග්‍ය ශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973 අප්‍රේල්**

ඉහත සඳහන් පරීක්ෂණය පහත සඳහන් දිනවල කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ:—

ලිඛිත පරීක්ෂණය : 1973.4.28 ආයතන සංග්‍රහය*

1973.4.28 ආරෝග්‍ය ශාලා සහ බෙහෙත් ශාලා පරිපාලනය

1973.4.28 ගිණුම්.

සිංහල/දෙමළ වාචික පරීක්ෂණය : පරීක්ෂණයේ දිනය විභාග කොමසාරිස් විසින් අපේක්ෂකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

*"රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා සහ කාර්ය සංවිධාන සංග්‍රහය" යනුවෙන් කලින් නම්කර තිබූ ප්‍රශ්න පත්‍රය දැන් "ආයතන සංග්‍රහය" යනුවෙන් නම්කර ඇති බව අපේක්ෂකයින් විසින් සටහන් කරගත යුතුය. මේ විෂයය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේදයන් පිළිබඳ දැනීමක් ඔවුන්ට තිබිය යුතුය:—

II, III, III (අ), V, VI, VII, IX, XVI, XXI, XXIX, XXX, XXXII, XXXIII, XXXV, XXXVI, XXXVIII, XXXIX, XL, XLI, XLIII සහ XLIV යන පරිච්ඡේද.

2. ඉල්ලුම්පත්‍ර, අනුබද්ධ ආකෘතියට අනුව ෆුල්ස්කැප් තීරුවක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ෆුල්ස්කැප් තීරුවේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය.

3. විභාගය, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීති රීති මෙම නිවේදනය අග පළකොට ඇත.

4. ඉල්ලුම්පත්‍ර 1973.3.15 දින හෝ ඉන් පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්ට ලැබෙන පරිදි විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කවර ඉල්ලුම් පත්‍රයක් වුවද, ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. යම්කිසි අපේක්ෂකයෙකුට විභාගයට, යටත් පිරිසෙයින් සති දවසකට කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඔහු විසින් ඒ බව අප්‍රමාදව, කොළඹ 2, තැ. පෙ. 1503 මැලේ වීදියේ විභාග කොමසාරිස්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග" කොළඹ කියා වේ.) ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතරම, පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය:—

(1) විභාගයේ නම :———.

(2) සම්පූර්ණ නම :———.

(3) සම්පූර්ණ ලිපිනය :———.

(4) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කල අංකය සහ තැපැල් කන්තෝරුව :———.

6. ඉහත 5 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

7. හැඳුනුම්පත් භාවිතය සම්බන්ධයෙන් 71.7.20 දින සහ අංක 836 දරණ මගේ පොදු චක්‍රලේඛයෙහි නැවත දක්වා ඇති විභාග කොමසාරිස්ගේ 71.6.29 සහ අංක එස්.ඊ/274 දරණ චක්‍රලේඛය කෙරෙහි සියලුම අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීම වනු ඇත.

8. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය:—

(අ) පළමු වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාව සඳහා—

| | රුපියල් |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා ... ... | 30 |
| එක් විෂයයකට ... ... | 10 |
| වාචික පරීක්ෂණය ... ... | 5 |

අපේක්ෂකයින් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිට ඇති අපේක්ෂකයින්ට, ඉහත දැක්වෙන පරිදි අදාල ගාස්තු ගෙවීමට නියම වේ.

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 පෙබරවාරි මස 1 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500,
කොළඹ.

### ඉල්ලුම් පත්‍රය

**වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ආරෝග්‍ය ශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973 අප්‍රේල්**

1. (අ) අගට යෙදෙන නම, මුල් අකුරු සමග :———.
   (ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :———.

2. පදවි නාමය :———.

3. වැඩ කරන ස්ථානය :———.

4. තැපැල් ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :———.

5. ගන්නා විෂයයන් (අදාල නොවන්න කපා හරින්න) :———.
   (අ) ආයතන සංග්‍රහය
   (ආ) ආරෝග්‍ය ශාලා සහ බෙහෙත් ශාලා පරිපාලනය
   (ඇ) ගිණුම්
   (ඈ) සිංහල (වාචික)
   (ඉ) දෙමළ (වාචික)

6. විභාගයට පෙනී සිටින්නේ කිනම් භාෂා මාධ්‍යයකින්ද :——.

7. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන්, වර්ෂය හා මාසයද සඳහන් කරන්න :———.

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

* මෙම ඉල්ලුම් පත්‍රයට අලවන මුද්දර මා විසින් අවලංගු කිරීමට පෙර වලංගු වූද, පාවිච්චි නොකරන ලද ඒවා බවද, ප්‍රකාශ කරමි.

| මුද්දර කොටුව |
|---|

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

### ආයතන ප්‍රධානියාගේ සහතිකය

* අපේක්ෂකයා මුද්දර නිසි පරිදි අලවා අවලංගු කර ඇති බව සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :———.

* ගාස්තු ගෙවීමට නොමැති විට කපා හැර දමන්න.

විභාග කොමසාරිස්,
කොළඹ 2.

ඉදිරිපත් කරමි.———.

———,
විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානියාගේ අත්සන.

දිනය :———.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ, යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්: ලියන කඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලැජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාග ශාලාධිපතිට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොනම කඩදසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පෑන් සල් තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පෑන් සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ තමන් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තරය ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු, අනික් කොටස පඩින් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවලට අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිවද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ඇලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනෙන් ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අශව්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

2-488—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනකාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි ... | 73. 1. 5 | සිකුරාද ... | 72.12.27 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.12 | සිකුරාද ... | 73. 1. 3 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.19 | සිකුරාද ... | 73. 1.10 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.26 | සිකුරාද ... | 73. 1.17 | බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි ... | 73. 2. 2 | සිකුරාද ... | 73. 1.24 | බදාදා | දවල් 12.00 |
| | 73. 2. 9 | සිකුරාද ... | 73. 1.31 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්දා... | 73. 2. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.23 | සිකුරාද ... | 73. 2.14 | බදාදා | දවල් 12.00 |
| මාර්තු ... | 73. 3. 2 | සිකුරාද ... | 73. 2.21 | බදාදා | දවල් 12.00 |
| | 73. 3. 9 | සිකුරාද ... | 73. 2.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.16 | සිකුරාද ... | 73. 3. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.23 | සිකුරාද ... | 73. 3.14 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.30 | සිකුරාද ... | 73. 3.21 | බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 4 | සිකුරාද ... | 73. 3.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.11 | බදාදා ... | 73. 4. 4 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්දා... | 73. 4.11 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.27 | සිකුරාද ... | 73. 4.18 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.